ටෙන්ඩර් දැන්වීම
කඩුවෙල මහා නගර සභාව

ස්වාධීන රූපවාහිනී ආයතනය අසල පිහිටි ජයවඩනගම උත්සව ශාලාව ව්‍යාපාරික කටයුතු සඳහා වසර 03ක කාලයකට මාසික කුලී පදනම මත බදු ලබා දීම

01. කඩුවෙල මහා නගර සභාවේ ටෙන්ඩර් කමිටුවේ සභාපති විසින් එම සභාවට අයත් පහත උප ලේඛනයේ සඳහන් දේපළ වසර 03ක් සඳහා මාසික කුලී පදනම මත කෙටි කාලීනව බදු දීම පිණිස ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාපටිපාටිය යටතේ මුද්‍රා තබන ලද ලංසුපත් භාර ගනු ලැබේ.

02. ටෙන්ඩර්පත් කට්ටලයක් සඳහා රු.1,500/- බැගින්, ඊට අදාළ පවත්නා රජයේ පවත්නා සියළු බදු මුදල් සමග (රු.1,770/-) ක් ගෙවා ප්‍රධාන කාර්යාලය, කඩුවෙල මහා නගර සභාවේ පළමු වන මහළේ පිහිටි නාගරික මුදල් දෙපාර්තමේන්තුවේ සරප් කවුළුව වෙත මුදල් ගෙවා ලබා ගත් රිසිට්පත හා ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය ඉදිරිපත් කර එම දෙපාර්තමේන්තුවේ ආදායම් අංශයෙන් ලංසු ලියවිලි ලබා ගත හැකි ය. මෙම ලංසු ලියවිලි ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැක.

03. ටෙන්ඩර්පත් 2024.07.05 දින සිට 2024.07.25 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 09.00 සිට ප.ව. 02.00 දක්වා නිකුත් කරනු ලැබේ. උත්සව ශාලාව සඳහා ගැණුම්කරුවෙකු තෝරාගනු ලබන්නේ පහත වගුවේ දැක්වෙන පදනම් මිලට වඩා ඉහළින් ඉදිරිපත් කරන මුදල අනුව වේ.

ටෙන්ඩර් අංකය	විස්තරය	ශාලාවේ ප්‍රමාණය		උත්සව ශාලාව සඳහා පදනම් මිල +VAT (අවම ලංසුව) රු.	ලංසු ඇපකරය රු.
		වර්ග මීටර	වර්ග අඩි		
කඩු/ම.න.ස./03/ජය.ප්‍රජා.ශාලා/2012(II)	ජයවඩනගම උත්සව ශාලාව	620.02	6739.05	150,000.00+VAT	22,500.00

04. ලංසුකරු ස්වකීය ලංසුව සමග ආපසු ගෙවනු ලබන ලංසු ඇපකරය (රු.22,500.00) නාගරික මුදල් දෙපාර්තමේන්තුවේ සරප් කවුළුව වෙත ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කළ යුතු අතර සම්පූර්ණ කරන ලද පිටපත් දෙකකින් යුතු ලංසු ලියවිලි මුල් පිටපත හා අනු පිටපත වෙන වෙන ම ලියුම් කවරවල බහා, කවර දෙකම එක කවරයක බහා මුද්‍රා තබන ලද ලපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ටෙන්ඩරයේ නම සහ අංකය සඳහන් කර **නාගරික කොමසාරිස්, කඩුවෙල මහා නගර සභාව, කඩුවෙල යන ලිපිනය** වෙත 2024.07.26 වන දින පෙ.ව.11.00ට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් නාගරික ගණකාධිකාරී නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් බහාලුමට පෞද්ගලිකව පැමිණ බහාලීම කළ හැකි ය.

05. ලංසු භාර ගැනීම අවසන් කළ වහාම (2024.07.26 පෙ.ව. 11.00ට) එම අවස්ථාවට පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ ලිඛිත බලය ලත් නියෝජිතයින් ඉදිරියේ අදාළ ලංසු විවෘත කරනු ලබන අතර, ප්‍රමාද වී ලැබෙන ලංසු ලේඛන ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ලංසුකරු ස්වකීය ලංසුව සමග ආපසු ගෙවනු ලබන (ලංසු ඇපකරය) ගිණුම් අංශයේ සරප් කවුළුව වෙත ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කළ යුතු අතර, පූර්ව ප්‍රසම්පාදන රැස්වීම 2024.07.19 දින පෙ.ව. 10.00ට ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරයේ දී පවත්වනු ලැබේ.

07. අවම ලංසුවට වඩා වැඩිම මිලක් ඉදිරිපත් කරන ලංසුකරු වෙත ටෙන්ඩරය පිරිනමන ලැබිය හැකි අතර අවම ලංසුවට වඩා අඩු මුදලක් ඉදිරිපත් කරන ලංසු ලේඛන ප්‍රතික්ෂේප කර, ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පතුව සභාව සතු කරනු ලැබේ. තව ද ලංසු, ලංසු භාර ගැනීමේ අවසාන දින සිට දින 91ක කාලයක් සඳහා වලංගු විය යුතු ය.

08. තෝරා ගත් ලංසුකරු වෙත දැනුම්දුන් පසු නියමිත දිනට පෙර අදාළ මුදල් ගෙවා ගිවිසුමට එළඹිය යුතු අතර ඔහු විසින් එකී මුදල් නොගෙවා ගිවිසුමට ඇතුළත් නොවුනහොත් ඔහු විසින් තබා ඇති ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පතුව සභාව සතු වන්නේ ය.

09. කිසිදු හේතු දැක්වීමකින් තොරව ඕනෑම හෝ සියළුම ලංසු ප්‍රතික්ෂේප කිරීමේ හෝ ලංසුවකින් යම් කොටසක් පිළිගැනීමේ අයිතිය කඩුවෙල මහා නගර සභාවේ ටෙන්ඩර් කමිටුවේ සභාපති සතු වේ.

10. ටෙන්ඩර් පිළිබඳ වැඩිමනත් පැහැදිළි කර ගැනීමට හා ගොඩනැගිලි සැලසුම් පිළිබඳව පරීක්ෂා කිරීමට අවශ්‍ය වන අයදුම්කරුවන් හට සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 08.30 සිට ප.ව. 03.30 දක්වා බත්තරමුල්ල දිස්ත්‍රික් කාර්යාලය මගින් හා ප්‍රධාන කාර්යාලයේ නාගරික මුදල් දෙපාර්තමේන්තුවේ ආදායම් අංශයෙන් ලබා ගත හැකි ය.

දුරකථන අංක : ප්‍රධාන කාර්යාලය - 011-2571200
බත්තරමුල්ල දිස්ත්‍රික් කාර්යාලය - 011-2867865

2024.07.05
කඩුවෙල මහා නගර සභා කාර්යාලයේදී ය.

දිල්රුක්ෂි ගමගේ,
නාගරික කොමසාරිස්,
සභාපති,
ටෙන්ඩර් කමිටුව.